# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - 11 ශ්‍රේණිය - 1 වාරය

## අත්‍යවශ්‍ය ඉගෙනුම් පල හා විෂයය අන්තර්ගතය

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂයය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් සඳහන් පිටු අංකය | පෙළ පොතේ පාඩම/ ක්‍රියාකාර කම් අංකය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| **7.0 තොරතුරු පිළිබඳ මූලික අවබෝධයෙන් යුතුව තොරතුරු රැස් කර ඉදිරිපත් කිරීමේ නිපුණතා ප්‍රදර්ශනය කරයි.** | 7.1 තොරතුරු දැනගැනීමේ අවශ්‍යතාවය හඳුනාගනිමින් තොරතුරු කාර්යයේ විකාශනය පැහැදිලි කරයි. | 1. තොරතුරු යන්න නිවැරදි ව හඳුන්වයි.<br><br>2. තොරතුරුවල විවිධත්වය නිදසුන් සහිත ව පෙන්වා දෙයි.<br><br>3. තොරතුරු දැන ගැනීමේ අවශ්‍යතාව හේතු සාධක සහිත ව විස්තර කරයි. | **7.0 තොරතුරු වාර්තාකරණය**<br>**7.1 තොරතුරු හැඳින්වීම**<br><br>3. තොරතුරු දැන ගැනීමේ පුද්ගල අවශ්‍යතාව<br><br>4. තොරතුරු දැන ගැනීමේ සමාජීය අවශ්‍යතාව | 1 - 3 | 1 - 5 | 01 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 7.2 සිදුවීම්, තොරතුරු හා ප්‍රවෘත්ති පිළිබඳ මූලික දැනුවත් බව ප්‍රදර්ශනය කරයි. | 1. සිදුවීම්, තොරතුරු, ප්‍රවෘත්ති අතර වෙනස පහදයි.<br>2. ප්‍රවෘත්ති දැන ගැනීමේ අවශ්‍යතාව පහදයි.<br>3. ප්‍රවෘත්ති අන්තර්ගතය සලකා ප්‍රවෘත්ති වර්ග කරයි.<br>4. ප්‍රවෘත්තියක වටිනාකම කෙරෙහි බලපාන සාධක හඳුන්වයි. | **7.2 සිදුවීම්, තොරතුරු හා ප්‍රවෘත්ති**<br>1. සිදුවීම්, තොරතුරු, ප්‍රවෘත්ති අතර වෙනස<br>2. ප්‍රවෘත්ති හඳුනා ගැනීම හා ප්‍රවෘත්තියක වටිනාකම කෙරෙහි බලපාන සාධක | 4 - 5 | 5 - 9 | 02 |
| | 7.3 තොරතුරු රැස් කිරීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ අවබෝධයෙන් යුතුව තොරතුරු රැස් කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | 1. තොරතුරු රැස් කිරීමේ විවිධ මූලාශ්‍ර හඳුන්වයි.<br>2. තොරතුරු රැස් කරන්නකු තුළ තිබිය යුතු ගුණාංග ප්‍රගුණ කරයි.<br>3. තොරතුරු රැස් කිරීමේ විවිධ ශිල්පීය ක්‍රම පෙන්වා දෙයි.<br>4. තොරතුරු රැස් කිරීමේ දී සැලකිය යුතු ආචාර ධර්ම භාවිත කරයි. | **7.3 තොරතුරු රැස් කිරීම**<br>1. තොරතුරු මූලාශ්‍ර<br>2. තොරතුරු රැස් කරන්නා තුළ තිබිය යුතු ගුණාංග<br>3. තොරතුරු රැස් කිරීමේ ශිල්පීය ක්‍රම<br>4. තොරතුරු රැස් කිරීමේ දී සැලකිය යුතු ආචාර ධර්ම | 6 - 7 | 9 - 13 | 02 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 7.4 තොරතුරු වාර්තා කිරීමේ හා තොරතුරු ඉදිරිපත් කිරීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ මනා අවබෝධයෙන් යුතුව තොරතුරු වාර්තා කිරීමේ නිපුණතා ප්‍රදර්ශනය කරයි. | 1. තොරතුරු වාර්තාකරණයේ අවශ්‍යතාව පෙන්වා දෙයි.<br><br>2. තොරතුරු ඉදිරිපත් කිරීමේ විවිධ ස්වරූප පැහැදිලි කරයි.<br><br>3. තොරතුරු ඉදිරිපත් කිරීමේ ශිල්පීය ක්‍රම හඳුන්වයි. | **7.4 තොරතුරු වාර්තාකරණය**<br>1. තොරතුරු සාර්ථක ව වාර්තා කිරීම (තොරතුරු ඉදිරිපත් කිරීමේ විවිධ ස්වරූප)<br><br>2. තොරතුරු සාර්ථක ව ඉදිරිපත් කිරීමේ ශිල්පීය ක්‍රම/තොරතුරු සාර්ථක ව ඉදිරිපත් කිරීමේ දී සැලකිය යුතු කරුණු (ලිඛිත හා කථන භාෂා භාවිත ප්‍රයෝග) | 8 - 9 | 13 - 16 | **02** |
| **8.0 මුද්‍රිත මාධ්‍යයේ විකාශනය, පුවත්පත් හා වෙනත් මුද්‍රිත මාධ්‍ය ප්‍රභේද, ඒවායේ අන්තර්ගතය පිළිබඳ අවබෝධයෙන්** | 8.1 ලේඛන කලාවේ විකාශනය හා මුද්‍රිත තාක්ෂණයේ විකාශනය පිළිබඳ මූලික තොරතුරු ගවේෂණය කරයි. | 1. සන්නිවේදන මාධ්‍යයක් ලෙස මුද්‍රිත මාධ්‍ය භාවිතයේ වැදගත්කම අගය කරයි. | **8.0 මුද්‍රිත මාධ්‍ය**<br><br>8.1 මුද්‍රිත මාධ්‍ය හැඳින්වීම | 10 - 11 | 17 - 18 | **01** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **යුතුව පුවත්පත් නිර්මාණකරණය ආශ්‍රිත ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරයි.** | 8.2 විවිධ මුද්‍රිත මාධ්‍යයන්ගේ අන්තර්ගතය හා ඒවායේ විවිධතා සන්සන්දනාත්මක ව හඳුනා ගනී. | 1. මුද්‍රිත මාධ්‍යයේ විවිධ ස්වරූප හඳුන්වා දෙයි.<br>3. මුද්‍රිත මාධ්‍ය ලෙස පොත්වල අන්තර්ගත විශේෂතා විස්තර කරයි.<br>4. මුද්‍රිත මාධ්‍ය ලෙස පුවත්පතෙහි විශේෂතා හඳුන්වයි.<br>5. මුද්‍රිත මාධ්‍ය ලෙස සඟරාවල විශේෂත්වය පෙන්වා දෙයි.<br>6. මුද්‍රිත මාධ්‍ය ලෙස පෝස්ටර් සහ අත්පත්‍රිකාවල විශේෂතා ප්‍රදර්ශනය කරයි. | **8.2 මුද්‍රිත මාධ්‍ය ස්වරූප**<br>1. පොත්<br>2. පුවත්පත්<br>3. සඟරා<br>4. පෝස්ටර්, අත්පත්‍රිකා | 13 - 15 | 24 - 29 | **02** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 8.3 ශ්‍රී ලංකාවේ පුවත්පත්, ඒවායේ ආකෘතිමය හා අන්තර්ගත විශේෂතා පිළිබඳ අවබෝධයෙන් යුතු ව පුවත්පත් නිර්මාණකරණයේ නියැලේ. | 1. මාධ්‍යයක් ලෙස පුවත්පත් මාධ්‍යයේ ප්‍රබලත්වය පෙන්වා දෙයි.<br><br>2. විවිධ ප්‍රභේද අනුව පුවත්පත් වර්ගීකරණය කරයි.<br><br>3. පුවත්පත්වල අන්තර්ගතය විශ්ලේෂණය කරයි.<br><br>5. විද්‍යුත් පුවත්පත් භාවිතයේ විවිධ ස්වරූප විස්තර කරයි.<br><br>6. පුවත්පත් අන්තර්ගතය සැලකිල්ලට ගෙන පුවත්පත් නිර්මාණයේ ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **8.3 පුවත්පත් මාධ්‍ය හඳුනා ගැනීම**<br>1. පුවත්පත් වර්ගීකරණය<br>- ප්‍රමාණය අනුව වර්ගීකරණය<br>- වාරය අනුව වර්ගීකරණය<br>- විෂය අනුව වර්ගීකරණය<br>- පාඨකයා අනුව වර්ගීකරණය<br><br>2. පුවත්පත් අන්තර්ගතය වටහා ගැනීම (ප්‍රවෘත්ති, කතුවැකි, විශේෂාංග, විචාර, වාර්තා, සංවාද, කාටූන්, තීරු ලිපි, ඡායාරූප, වාර්තා, වෙළෙඳ දැන්වීම්)<br><br>3. පුවත්පත් අන්තර්ගතයේ විශේෂතා<br>- කාලානුරූප අන්තර්ගතය<br>- අන්තර්ගතයේ මුද්‍රණ ශිල්පීය විවිධතා<br>- අන්තර්ගතය සඳහා නිර්මාණශීලී ආකෘති | 16 - 17 | 30 - 43 | **02** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | - පෙළ රූපය අතර සබඳතාව<br>- විද්‍යුත් පුවත්පත<br><br>4. පුවත්පත් භාවිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් **(පැවරුම)**<br>- ආකර්ෂණීය පුවත්පත් නිර්මාණ ඉදිරිපත් කිරීම් (පුවත්පත්/ බිත්ති පුවත්පත් සැකසීම) | | | |
| **දින 21ක් සඳහා කාලච්ඡේද 03 බැගින් මුළු කාලච්ඡේද සංඛ්‍යාව** | | | | | | 12 |